" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204. டென்சில் கொப்பேகடுவ மாவத்தை. பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/02-105/FI/01 (B) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | |
| දිනය / திகதி / Date | 2020.02.06 | | |

**<u>පාලන චක්‍රලේඛ අංකය : 03/2020</u>**

ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප.),

ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභාව,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),

කොමසාරිස් (පළාත් පාලන/ නිවාස/ පරිවාස) දෙපාර්තමේන්තුව (බ.ප.),

අධ්‍යක්ෂ (කෘෂිකර්ම/ කර්මාන්ත/ සමාජ සේවා) දෙපාර්තමේන්තුව (බ.ප.),

විගණන අධිකාරි, රජයේ විගණන අංශය,

අධ්‍යක්ෂ, (අභ්‍යන්තර විගණන),

අධ්‍යක්ෂ, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.),

සාමාන්‍යාධිකාරි, සංචාරක මණ්ඩලය (බ.ප.),

ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරි,

<u>බත්තරමුල්ල නව පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත ආපනශාලාවෙන් ආහාර පාන මිලදී ගැනීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2019.08.22 දිනෙන් යුතුව නිකුත් කරන ලද පාලන චක්‍රලේඛ අංක 06/2019 මෙයින් අවලංගු කරනු ලැබේ. ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. බත්තරමුල්ල පළාත් සභා ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටි ආපනශාලාව පවත්වාගෙන යනු ලැබූ Freshco's (Pvt) Ltd ආයතනය 2019.10.15 දින සිට ඉවත් වීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව දෙවන ලංසුකරුවන Gold Spoon ආයතනය තෝරාගෙන ඇත.

03. මෙම පරිශ්‍රය තුළ පවත්වනු ලබන රැස්වීම්, උත්සව හා විවිධ අවස්ථා සඳහා මෙම ආපනශාලාවෙන් ආහාරපාන ලබාගත හැකි අතර මිල ගණන් කැඳවීමකින් තොරව සෘජුවම ආහාරපාන මිලදී ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇත. මෙම අනුමැතිය මත සෘජුවම ආහාරපාන මිලදී ගැනීමේදී පළාත් සභා ගොඩනැගිල්ලෙහි පිහිටි ආහාරපාන කමිටුව විසින් අනුමත කරන ලද මේ සමඟ අමුණා ඇති ඇමුණුම්වල දැක්වෙන මිල ගණන් නොඉක්මවිය යුතුය.

| විස්තරය | ඇමුණුම් |
|---|---|
| I. ප්‍රසම්පාදනය කැඳවන අවස්ථාවේ ප්‍රසම්පාදන කොන්දේසි යටතේ එකඟතාවයකට පැමිණි ආහාර සහ ඒවායේ මිල ගණන් ඇතුළත් ලේඛනය | ඇමුණුම 1 |
| II. ප්‍රසම්පාදනය කැඳවන අවස්ථාවේ තීරණය නොවූ, ආපනශාලාවෙන් ලබා ගත හැකි, ආහාර පාන කමිටුව විසින් අනුමත කරන ලද ආහාර සහ එම මිල ගණන් ඇතුළත් ලේඛනය | ඇමුණුම 2 |
| III. පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුල පවත්වනු ලබන රැස්වීම්, උත්සව හා විවිධ අවස්ථා සඳහා ආපනශාලාවෙන් ලබා ගත හැකි, ආහාර පාන කමිටුව විසින් අනුමත කරන ලද ආහාර සහ එම මිල ගණන් ඇතුළත් ලේඛනය | ඇමුණුම 3 |
| IV. මෙම ගොඩනැගිල්ලේ පවතින රැස්වීම්, උත්සව හා සම්මන්ත්‍රණ අවස්ථා සඳහා බුෆේ ක්‍රමය යටතේ ලබාගත හැකි ආහාර සහ මිල ගණන් ඇතුළත් ලේඛනය. මෙය කොටස් 2කි. | |
| a. මාණ්ඩලික නිලධාරීන් පමණක් සහභාගිවන රැස්වීම්වල ආහාර සහ මිල ගණන් ඇතුළත් ලේඛනය | ඇමුණුම 4 |
| b. අනෙකුත් නිලධාරීන් සහභාගිවන රැස්වීම්වල ආහාර සහ මිල ගණන් ඇතුළත් ලේඛනය | ඇමුණුම 5 හා 6 |

04. ආපනශාලා කවුන්ටරයෙන් මිලදී ගනු ලබන ආහාර සඳහා ගෙවිය යුතු උපරිම මිල ඇතුලත් මිල දර්ශකය ඇමුණුම් අංක 1 හා 2න් දැක්වේ.

05. ඇමුණුම් අංක 3, 4, 5 හා 6 හි දැක්වෙන ආහාර වට්ටෝරු, රැස්වීම්, උත්සව වැනි විවිධ අවස්ථා සඳහා එම මිල ගණන් යටතේ ලබාගත හැකි අතර ඒවා මෙම ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාල විසින් අවශ්‍ය පරිදි ඇණවුම් කර ලබාගත හැකි වේ. එවැනි අවස්ථාවලදී මෙම ආහාර භාවිතා කළ හැකි වනුයේ ආපනශාලා පරිශ්‍රයේ හෝ මෙම ගොඩනැගිල්ලේ ආහාර ගැනීම සඳහා වෙන්කොට ඇති ස්ථානයන්හි පමණි.

06. යම් අවස්ථාවක දී විශේෂ හේතු මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ආහාර මිලදී ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මෙම චක්‍රලේඛය බාධාවක් නොවේ.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,<br>
ප්‍රධාන ලේකම්,<br>
බස්නාහිර පළාත.

පිටපත් :

1. විගණකාධිපති - කා.දැ.ස
2. කළමනාකරු - ආපනශාලාව - කා.දැ.ස

<u>මිල ගණන් කැඳවන අවස්ථාවේ අනුමත කරන ලද මිල ගණන්</u>

## Food items for Lunch Menu

| Item No | Food Item | Quantity | Complementary Price |
|---|---|---|---|
| 1 | Veggie Rice & 3 Curries Lunch Packet with papadam | 1 | 80.00 |
| 2 | Fish Rice & 3 Curries Lunch Packet with papadam | 1 | 100.00 |
| 3 | Egg Rice & 3 Curries Lunch Packet with papadam | 1 | 100.00 |
| 4 | Chicken Rice & 3 Curries Lunch Packet with papadam | 1 | 120.00 |
| 5 | Chicken Fried Rice with Chopsuey & Chile Paste | 1 | 150.00 |
| 6 | Fish Fried Rice | 1 | 140.00 |
| 7 | Egg Fried Rice | 1 | 140.00 |
| 8 | Plain Rice plate | 1 | 20.00 |
| 9 | Potato Curry | 1 | 50.00 |
| 10 | Dhal Curry | 1 | 50.00 |
| 11 | Egg Curry | 1 | 40.00 |
| 12 | Chicken Curry | 1 | 60.00 |
| 13 | Fish Curry | 1 | 50.00 |
| 14 | Dried Sprats Curry | 1 | 40.00 |
| 15 | Pol Sambol | 1 | 25.00 |
| 16 | Vegetable Chopsuey | 1 | 40.00 |
| 17 | Boiled Egg | 1 | 35.00 |

**Food Items for Breakfast Menu**

| Item No | Food Item | Quantity | Complementary Price |
|---|---|---|---|
| 1 | Rice & Curry Packet (Chicken) | 1 | 70.00 |
| 2 | Rice & Curry Packet (Fish) | 1 | 60.00 |
| 3 | Rice & Curry Packet (Egg) | 1 | 60.00 |
| 4 | Rice & Curry Packet (Veggie) | 1 | 50.00 |
| 5 | Noodles (Chicken) | 1 | 80.00 |
| 6 | Noodles (Fish) | 1 | 70.00 |
| 7 | Noodles (Egg) | 1 | 70.00 |
| 8 | Noodles (Veggie) | 1 | 60.00 |